## දෙකොටසටම ලියවෙන එකම විවෘත ලිපියක්

පළමුව අතිගරු ජනාධිපති තුමන් වෙත

රාජපක්ෂ පරපුරේ ඉතිහාසය පිළිබඳව පූර්ණ දැනුමක් ඇති හැත්තෑ වසරක් පුරා එම පරපුර සමග සබඳකම් ඇති මාධ්‍යවේදියෙකු වශයෙන් මේ ලිපිය ලියන්නට අදහස් කලෙමි.

රාජපක්ෂ පරපුරේ වර්තමාන ක්‍රියාකාරින් අතරද මේ චරිත වල සංකලනයක් අපට පෙනෙන්නට තිබේ. මහින්ද රාජපක්ෂ නැමති ඔබේ චරිතය තුල ඩී. එම්. රාජපක්ෂ ගේ ජව වේගයත්, ඩී. ඒ. රාජපක්ෂ ගේ තපෝගුණයත් එසේම ඉතා සුළු ප්‍රමාණයෙන් හෝ ලක්ෂ්මන් රාජපක්ෂ ගේ දඩබ්බර ගති ගුණ සමග ජෝර්ජ් රාජපක්ෂ ගේ බුද්ධිමත් විචාරණයත් මුසු වී ඇති බව පෙනේ.

එහෙත් මීට පෙර කිසිම රාජ්‍ය නායකයකු මුහුණ තුවාල සිදු වූ බව අමතක කල හැකි ද? 1977 මහජන ඡන්දයෙන් පත් වූ මන්ත්‍රිවරු 168 දෙනා අතරින් 20 ඝාතනයට ගොදුරු වුනා. එසේ ගොදුරු වුවන්

*අතිගරු ජනාධිපති තුමනි, මනාප ක්‍රමය අහෝසි කිරීමට එඩිතර පියවරක් ගත් ඔබ තුමා එය වහාම ක්‍රියාත්මක නොකිරීම නිසා ඇති වූ ලේ වැගිරීම ගැන ප්‍රබුද්ධ ජනතාව කලකිරීමට පත් වූ බව නිසැකය.*



# අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහ විවේචනය කරන Counter Point ඇතුළු සෑම අංශයකටම

ප්‍රවීණ මාධ්‍යවේදී
**එස් පියසේන**

රාජපක්ෂ පරපුරේ පුරෝගාමියා වූ ඩී. එම්. රාජපක්ෂ ශ්‍රී මතානන් මා දැනහැඳින සිටියේ 1943 වසරේ සිටය. (1962 මා ලියූ තාත්තලා පුතාලා ලිපි පෙළේ "රුහුණේ සිංහයා සහ ..." ලිපිය ඔබ දන්නෙහිය)

ඩී. එම්. රාජපක්ෂ ශූරීන් සතු එඩිතර ජව වේගය අප රටේ යටත් විජිත වාදයට එරෙහිව සටන් කල ඉතිහාසයේ ප්‍රමුඛ තැනක් ගනී. සුදු ඒජන්තවරයකුට හම්බන්තොට තානායමේ දි ඔහුගේ වෙරි හිදෙනතුරු සෙරෙප්පුවෙන් පහරදීම සිහිපත් කල හැක. 1940 මුල් ඔය සිද්ධියේදි ගෝල්ෆේස් පිට්ටනියේ දහස් ගනන් වූ ජනකාය අමතමින් "අපි සහෝදරවරුනි මේ ඊඹනි මහත්තයාට ෂගඨගඡග වෙනුවට ඡගෂගඨ කිව්වොත් නරකද ? ඇයි සහෝදරවරුනි Inspector of Police කියනවා වෙනුවට Police Inspector General කිව්වොත් ආදි වශයෙන් කල කථාව අපට අදත් මතකය."

එසේම 1943 දි කොළඹ විවේකානන්ද ශාලාවේ පැවැත්වුනු රැස්වීම අපට මතකය. එම රැස්වීම පවත්වන ලද්දේ මහත්මා ගාන්ධි ගේ බිරිඳ වූ කාස්තුර් බා ගාන්ධි මැතිණියගේ අභාවයට ශෝකය පළ කිරීමටයි. එහිදි කළ ප්‍රකාශයෙන් බිඳක් මෙසේය.

"කස්තුර්බා ගාන්ධි මැතිණිය වෙනුවෙන් අප උපහාර දැක්විය යුත්තේ ඇය දේශප්‍රේමීත්වය අතින් කිසිවෙකුට නොදෙවෙනි වූ නිසාය.

ගරු ජනාධිපති තුමනි, රාජපක්ෂ පවුලේ ඩී. එම්. රාජපක්ෂ එඩිතර අධිරාජ්‍ය විරෝධි ජව වේගයෙන්ද ඩී. ඒ. රාජපක්ෂ මැතිතුමන්ගේ තැන්පත් තපෝගුණයෙන් ද යුත් චරිතයද, ලක්ෂ්මන් රාජපක්ෂ ගේ දඩබ්බර දේශපාලන චරිතය ද, ජෝර්ජ් රාජපක්ෂ ගේ බුද්ධිමත් විවේචනාත්මක චරිතයද අපට අමතක නොවේ.

නුදුන් අභියෝගන්ට ඔබ මුහුණ දුන් බව සැබෑය. ඒ දුෂ්කර ගමනේදි ඔබ අතින් සැලකිය යුතු තරමක වැරදි තීරණ පෙනෙන්නට වුවහොත් ජනතාව අතර එක්තරා ප්‍රමාණයක කලකිරීමක් ඇති වීම අස්වාභාවික නොවේ.

දැන් මා යොමුවන්නේ විවේචන පිළිබඳවයි

අප සඟරාවේ නොවැම්බර් කලාපයේ " Counter



Point සහ "ආණ්ඩුවට" ස රෝගය" යන ලිපි දෙක පිළිබඳව ආවර්ජනයකි.

මේ ලිපි දෙකෙන්ම පෙන්වන්නට උත්සාහ කරන්නේ ශ්‍රී ලංකාව ඉතා බිහිසුණු Killing Fields තත්වයකට යොමු වී ඇති බවය. මේ ලිපි ලියන මහත්වරුන් අමතක කර ඇත්තේ, අපේ මවු බිම " Killing Fields " ආගාධයට යොමු වුයේ 1980 දශකයේ පටන් බවය.

1977 පාර්ලිමේන්තුවට තේරි පත් වූ මන්ත්‍රිවරු 168 දෙනෙකු අතරින් විසි දෙනෙක්ම ඝාතනයට ගොදුරු වූ බව අපට අමතක කල හැකිද ? පාර්ලිමේන්තු සභාගර්බය තුලදීම, දෙණියාය කීර්ති අබේවික්‍රම මහතා මරා දමමින් ලලිත් ඇතුලත්මුදලි සහ ගාමිණි ජයසුරිය වැනි ඇමතිවරුන් ට මාරාන්තික අතර ආර්. ප්‍රේමදස, ලලිත් ඇතුලත්මුදලි, ගාමිණි දිසානායක, වීරසිංහ මල්ලිමාරච්චි වැනි ඇමතිවරු පමණක් නොව විපක්ෂ නායක අමිර්තලිංගම්, යාපනය මන්ත්‍රි යෝගේෂ්වරන්, කුඩුවිල් මන්ත්‍රි ධර්මලිංගම් වැනි විශිෂ්ඨ ගණයේ දේශපාලඥයින් වුහ.

ඉන් ඉක්බිති 1989 පාර්ලිමේන්තු මැතිවරණය දෙසට හැරෙමු. නාම යෝජනා පත්‍ර බාරදුන් දිනයේ සිට මැතිවරණ පැවතුණ දින දක්වා විපක්ෂ අපේක්ෂකයින් 13 දෙනෙක් ඝාථනයට ගොදුරු විය. එකම ආණ්ඩුපක්ෂ අපේක්ෂකයෙක්වත් එම අවදානමට මුහුණ නොපෑවේය. ඒ මක් නිසාද යත් ඔවුන්ට ඕනෑවටත් වඩා ආරක්ෂාව තිබූ නිසාය. මේ අතීතය දෙස බලන විට අද සිදුවන අවාසනාවන්ත සිද්ධීන් ඉතාම සුළු වශයෙන් සැලකිය හැකිය. මුල්ලේරියා-වේ සිදු වූ අවාසනාවන්ත මිනිස් ඝාතනය හැම අතින්ම අපේ ඊනියා මැතිවරණ මනාප ක්‍රමයේ ප්‍රතිඵලයකි.

**යලිත් අපි ජනාධිපතිතුමා වෙත යොමු වෙමු.**

අතිගරු ජනාධිපති තුමනි, මනාප ක්‍රමය අහෝසි කිරීමට එඩිතර පියවරක් ගත් ඔබ තුමා එය වහාම ක්‍රියාත්මක නොකිරීම නිසා ඇති වූ ලේ වැගිරීම ගැන ප්‍රබුද්ධ ජනතාව කලකිරීමට පත් වූ බව නිසැකය. එසේම පාර්ලිමේන්තුවේ බහුතර ආසන තබා ගැනීම පිණිස බරපතල දුෂණ හා චෝදනා වලට ලක් වී ඇති පුද්ගලයින් ආණ්ඩුවට සම්බන්ධ කර ගැනීම අනාගතයේදි නොව දැනටම රජයට අනිෂ්ඨ ප්‍රතිඵල ගෙන දෙන බව ඔබ තුමා විසින් යම් යම් අයට දෙන ලද සමාවන් ගැන බුද්ධිමත් ජනතාවගේ අසතුටක් පලවුවහොත්, එය පුදුමයක් නොවේ. එබඳු සමාවන් ගැන කථා කරන විට, ඔබගේ මාධ්‍ය විවේචකයින්, ඒවා සාධාරණීකරනය කිරීම සඳහා ගන්නා පියවර බොලඳය. සබරගමුවේ දීප්තිමත් තරුණ දේශපාලඥයින් දෙදෙනෙකු වන අතුල ආටිගල සහ නන්ද එල්ලාවල යන දෙදෙනාගේ ලපටි දේශපාලන ජිවිත වෙඩිපාර වලින් අහෝසි විය.

මේ සිද්ධීන් ගෙන හැර පාන විට, ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන විසින් ස්ත්‍රි දුෂණය සඳහා පහලොස් වසරක සිර දඬුවම නියම වූ ගෝනවල සුනිල්ගේ සිද්ධිය ඉස්මතු කිරීම හේතුවක් නොවේ.

1977 සිට අතිවිශාල වශයෙන් දේශපාලන ඝාතන අප රටේ සිදු වූ බව ඇත්තකි. නමුත් ඒවා අවතක්සේරු කළ හැකි නොවේ. එහෙත් මේ පිළිබඳව ඔබගේ අවධානය සඳහා 1958 පාර්ලිමේන්තු හැන්සාඩ් ගත සිද්ධියක් අවසාන වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

1958 රාජාසන විවාදයේදි එවකට මන්ත්‍රිවරු පස්දෙනෙකුට හෝ හය දෙනෙකුට සීමා වූ එක්සත් ජාතික පක්ෂයේ මතුරට මන්ත්‍රි එම්. ඩී. බණ්ඩා මහතා රාජාසන විවාදය පිළිබඳ කථාව පවත්වමින් සිටියේය. භාෂක ප්‍රතිපත්තිය ගැන ඔහු සඳහන් කල සමහර දේ ගැන කුපිත වූ අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක,

අගමැති බණ්ඩාරනායක - " ඔබගේ පක්ෂය මුළු රටම විනාශ කල (your party ruined the whole country) බණ්ඩා මහතා මෙයින් කලබල වුයේ නැත. ඔහුගේ පිළිතුර වුයේ කුමක් ද?

එම්. ඩී. බණ්ඩා - "එය ඔබත් එසේ කරන්නට හේතුවක් නොවේ" (that's no reason, why you should also do it)"

■

තුන්වන පිටෙන්

මෙවැනි සිදුවීම් මීට පෙරද පාර්ලිමේන්තුව තුළ විශාල වශයෙන් සිදුවී ඇත. වරක් 2004 වර්ෂයේදී කථානායක තෝරා ගැනීමේදී බරපතල ගැටුමක් පාර්ලිමේන්තුව තුළ සිදුවිය. එහිදී මර්වින් සිල්වා ඇමතිවරයා හෙළ උරුමයේ පාර්ලිමේන්තු මන්ත්‍රිව සිටි පූජ්‍ය කොලොන්නාවේ ශ්‍රී සුමංගල හිමියන්ගේ රහසඟ පෙදෙසට පවා පහරදීම හේතුකොටගෙන උන්වහන්සේට රෝහලේ පවා නැවැතී ප්‍රතිකාර ගැනීමට සිදුවූහ. එවැනි බරපතළ දෙයක් පවා සිදු කළ මර්වින් සිල්වාට විරුද්ධව ආණ්ඩුව කුමන පියවරක් ගත්තේද? කිසිවක් නැත. ඔහු අදටත් පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් හැසිරෙන්නේ පාතාල අපරාධකාරයින් අභිබවා යන දරුණු ඝණයේ පුද්ගලයෙකු ලෙසය.

වර්තමානය වන විට පාර්ලිමේන්තුව තුළ පමණක් නොව, රට තුළ ද නීතිය වල් වැදී ඇත. එය ලංකාවේ මෙතෙක් කිසිදු දිනක නොදුටු ආකාරයේ ශෝචනීය ස්වභාවයකින් නීතිය කඩා වැටීමක් වනවාට සැක නැත.

1988, 89 යුගය තුළ පැවති එක්සත් ජාතික පකෂ ආණ්ඩු භීෂණයේදී ජනතා මර්දන හස්තය එළි පිටම පාහේ ක්‍රියාත්මක විය. අද එවැනි ස්වභාවයක් මතු පිටින් නැතත් යටින් ඉතාමත් ප්‍රබල ලෙස ක්‍රියාත්මක වේ. නිවැරදි ආකාරයට බැලුවහොත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තිරය පිටුපස සිට රට පුරා දියත් කර ඇති නිලනොලත් භීෂණකාරී සහ මර්දනකාරී ස්වභාවය 1988, 89 භීෂණකාරී තත්වයටත් වඩා ඉහළ අගයක් ගනු ඇත.

අද වන විට මහින්ද රාජපකෂ ආණ්ඩුවේ අත්තනෝමතික වැඩ වලට එරෙහිව ක්‍රියා කිරීමේ හැකියාවක් විරුද්ධ දේශපාලන මත දරන්නන්ට ඉඩ ලබා දී නැත. යම් හෙයකින් එවැනි පිරිස් ආණ්ඩුවට විරුද්ධව ක්‍රියා කරන විට මර්දනය කර විනාශ කර දැමීමට ආණ්ඩුව සැදී පැහැදී සිටිති.

මේ තුළ මාධ්‍ය පවා පසුවන්නේ දැඩි පසුබෑමකය. ආණ්ඩුවේ මර්දන හස්තයට එරෙහිව නැගී සිටීමේ හැකියාවක් මාධ්‍යයට ද නැත. ආණ්ඩුවට එරෙහි වූ මාධ්‍යවේදීන්ට සිදු වන්නේ නාඳුනන තුවක්කුකරු-වෙකුගේ ගොදුරක් බවට පත්වීමටය. ලසන්ත වික්‍රමතුංග, ප්‍රදීප් එක්නැලිගොඩ ඊට කෙටි උදාහරණයන්ය. ඔවුන්ට සිදු වූ අනර්ථකාමී තත්වය පිළිබඳ නිසි පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන්ට එරෙහිව පියවර ගැනීමටවත් ආණ්ඩුවට මෙතෙක් කිසිදු උත්සාහයක් ගෙන නැත.

පසුගියදා ජාත්‍යන්තර සමුළුවකට සහභාගී වූ හිටපු නීතිපති මොහාන් පීරිස් මහතා ප්‍රකාශ කර සිටියේ අතුරුදහන් වූ බව කියන මාධ්‍යවේදී ප්‍රදීප් එක්නැලිගොඩ විදේශ රටක දේශපාලන රැකවරණ යටතේ ජීවත් වන බවය. එය සත්‍යයක් නම් ඔහු ජීවත්වන රට සිටින ස්ථානය යනාදී සියලුම කරුණු අනාවරණය කිරීමේ හැකියාවක් මොහාන් පීරිස් මහතාට තිබිය යුතුය. නමුත් ඔහු එවැනි අනාවරණයක් මෙතෙක් කර නැත. එමගින් හැගී යන්නේ ජාත්‍යන්තර සමුළුවකට පවා සහභාගී වී මොහාන් පීරිස් බොරු බේගල් ටොන් පවයක් ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඇද බෑ බවය.

ප්‍රදීප් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීමේ අපවාදයට ලක්වී සිටින්නේ මහින්ද රාජපකෂ ආණ්ඩුවය. ඉන් ගැලවීම උදෙසා මොහාන් පීරිස් ප්‍රදීප් එක්නැලිගොඩගේ අතුරුදහන් වීම වෙනත් දිසාවකට යොමුකර ඇඟ බේරා ගැනීමට මින් උත්සාහ කල බවක් පෙනේ. නමුත් සිදුවී ඇත්තේ ඇඟ බේරා ගැනීම නොව, මෙවැනි ව්‍යාජ ප්‍රකාශයක් ජාත්‍යන්තරය හමුවේ ප්‍රකාශ කිරීමෙන් ආණ්ඩුව හත්පොළේ ගා ගැනීමකි.

වර්තමානය වන විට ආණ්ඩුවේ මැති ඇමතිවරුන් පමණක් නොව, ඔවුන්ගේ කේවට්ටයන් පවා ප්‍රකාශ කරන දේවල් පිළිගැනීමට මහජනතාව එතරම් උනන්දුවක් දක්වන්නේ නැත. " නඩුත් හාමුදුරු-වන්ගේ බඩුත් හමුදුරුවන්ගේ කීවා සේ අද වන විට රට නීතියක් නැති තත්වයකට පත්ව ඇත.

රට තුළ වැඩිපුර ක්‍රියාත්මක වන්නේ කැකිල්ලේ රජ්ජ-රුවන්ගේ නඩු තීන්දුය. අද අධිකරණ වලට නඩුකාර-වරු පත් කරන්නේත් අස් කරන්නේත් ජනාධිපතිවරයාය. නීතිය ක්‍රියාත්මක වන්නේත් ඔහුට අවශ්‍ය ආකාරයටය. එවැනි ස්වභාවයක් තුළ අධිකරණය දෙන ඇතැම් තීන්දු තීරණ පවා මහජනතාවගේ විවේචනයට ලක් වී ඇත. ජෙනරල් සරත් ෆොන්සේකාගේ සුදු කොඩි නඩු තීන්දුව මීට කදිම නිදසුනකි.

අප දන්නා ආකාරයට යම්කිසි පුවත්පතක යම්කිසි වැරදි සහගත ප්‍රකාශයක් එළ වුවහොත් ඊට විරුද්ධව නඩු පවරන්නේ පුවත්පතේ කර්තෘවරයාට හා ප්‍රකාශකයාටය. එසේ නොමැතිව ප්‍රකාශය කල පුද්ගලයාට විරුද්ධව නඩු පවරා ඔහුව සිරගත කිරීමේ ක්‍රමවේදයක් නැත නමුත් සරත් ෆොන්සෙ-'කාගේ සුදු කොඩි නඩු තීන්දුවේදී සිදුවූයේ අපූරු දෙයකි. එනම් ඔහු කළ බව කියන ප්‍රකාශයට විරුද්ධව නඩු පවරා හිරේ විලංගුවේ දැම්මේ පුවත්පතේ කර්තෘ හෝ ප්‍රකාශකයා නොව, එම ප්‍රකාශය කළ සරත් ෆොන්සේකාවය.

එමගින්ම අපට මහින්ද රාජපකෂ ආණ්ඩුවේ නීතිය ක්‍රියාත්මක කරන ආකාරය පැහැදිලිය. ඔහුට අවශ්‍ය තමන්ට එරෙහිව නැගී සිටින බලවේග විනාශකර දැමීමටය. එසේ නොමැතිව සර්ව සාධාරණ නීති ක්‍රමවේදයක් රට තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් ආණ්ඩුවට නැත.

ආණ්ඩුව කරන්නේ නීතියේ රාමුවට මුවා වී ප්‍රතිවාදීන්ගෙන් පෞද්ගලික පළිගැනීමකි. ජෙනරල්වරයාට දිගින් දිගටම මුහුණ පෑමට සිදුව ඇත්තේ ද එවැනි අකරතැබ්බයකටය.

අප දන්නා ආකාරයට එකම සිද්ධියට අධිකරණ දෙකක නඩු දෙකක් පැවරෙන්නේ නැත. නමුත් හයි-කොප් ගනුදෙනුව මුල් කරගෙන සරත් ෆොන්සෙ-'කාට එරෙහිව යුද අධිකරණයේ නඩු පවරා වැරදිකරු කර මහාධිකරණයේද ඔහුට විරුද්ධව එම සිද්ධිය මුල් කරගෙන තවත් නඩුවක් පවරා ඇත.

මෙලෙස තම පවුල්වාදයට එරෙහිව නැගී සිටින බලවේග වලට එරෙහිව රාජපකෂ ආණ්ඩුව නීතියේ රාමුවකට මුවා වී මහජනතාවගේ විවේචනයට ලක් වන නඩු තීන්දු හරහා ප්‍රතිවාදීන් මර්දනය කලද තම ආණ්ඩුවේ සුවච කීකරු ගෝලයෝ මොන අසි-ක්කිත වැඩ කළ ද ඔවුන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට රාජපකෂ ආණ්ඩුව දක්-වන්නේ අඩු සැළකිල්ලකි.

ආණ්ඩුවේ ගෝතකර්ම ගෝලබාලයෝ මොන තරම් රාජ්‍ය දේපළ උළාගෙන කමින් වංචනික ක්‍රියාවල යෙදෙන්නේ ද ? එහෙත් ඒවාට එරෙහිව රාජපකෂ ආණ්ඩුව ගෙන ඇති පියවර කුමක් ද? කිසිවක් නැත. නියෝජ්‍ය අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන රුපියල් ලකෂ හතළිස්පන්දාහක් අයුතු සහගත ලෙස උපයා ඇති බවට අල්ලස් හෝ දූෂණ විමර්ෂන කොමිෂන් සභාවට පැමිණිලි ලැබී ඇතත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ආණ්ඩුව පියවර ගෙන නැත. එම පරීකෂණ පැවැත්වීමට උත්සුක වූ අල්ලස් කොමිෂමේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු පවා වහාම ඉන් ඉවත් කිරීමට ආණ්ඩුව පියවර ගත්තේ තම ගෝලබාලයන් ආරකෂා කිරීමටය.

පසුගියදා පාඩු ලබන පෞද්ගලික ආයතන 37 ක් කඩිමුඩියේ ආණ්ඩුවට පවරා ගැනීමට ක්‍රියා කරනු ලැබීය. ආණ්ඩුවේ පාඩු ලබන අති විශාල වූ ආයතන ඉන් මුදවා ගැනීමට නොහැකිව ලතවෙන ආණ්ඩුව තවත් පෞද්ගලික ආයතන රජයට පවරා ගැනීමෙන් සිදු කරන්නේ රටේ ආර්ථිකය තවත් වළ පල්ලට තල්ලු කර හැරීමට ද ? යන්න ප්‍රශ්නයක් මතු වේ. ජනාධිපති මහින්ද රාජපකෂ මහතාගේ

17 වන පිටට